# දෙමළ ජාතිවාදයට පණ දෙන බටහිර ත්‍රස්තවාදය

ලංකාවේ සිදු වී ඇතැයි කියන ඊනියා මානව අයිතීන් කැඩීම් පිළිබඳ ව එක්සත් ජාතීන්ගේ සංවිධානයෙහි ලේකම්ට උපදෙස් දීම සඳහා තිදෙනකුගෙන් සමන්විත මණ්ඩලයක් පත්කෙරී ඇත. අප පළමුව කළ යුත්තේ එවැනි මණ්ඩලයක් අඩුම තරමෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සම්ප්‍රදායට හා නීති රීතිවලට (ඒ පිළිබඳ කිසිම ගෞරවයක් නැතත්) වුවත් එකඟ නොවන බව පෙන්වා ඒ මණ්ඩලය මුළුමනින් ම ප්‍රතික්ෂෙප කිරීම ය. එයට_අමතරව හැකිනම් එක්සත් ජාතීන්ගේ සංවිධානයෙහි බටහිර නොවන රටවල් හැකිතාක් සම්බන්ධ කරගනිමින් බෑන් කී මූන්ගේ මණ්ඩලය ප්‍රතික්ෂෙප කිරීම සඳහා එහි දී යෝජනාවක් සම්මත කර ගැනීම ය. හැකිනම් බෑන් කි මූන්ට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් සම්මත කර ගැනීමට ද කටයුතු කළ යුතු ය. ඒ කුමක් කළත් නැතත් මේ මණ්ඩලයට හෝ එහි සාමාජිකයන්ට පෞද්ගලිකව හෝ ලංකාවේ පස් පෑගීමට ඉඩ නොදිය යුතු ය.

බෑන් කි මූන් යනු එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් වැටුප් ලබන පඹයකු පමණකි. ඔහුට බටහිරයන්ගේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හැරෙන්නට වෙනත් දෙයක් කළහැකි නො වේ. බටහිර නොවන රටවල් තවමත් තේරුම් නොගත්ත ද අද එක්සත් ජාතීන්ගේ සංවිධානය ක්‍රියාත්මක වන්නේ බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයේ ප්‍රධාන හස්තයක් ලෙස ය. බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදය වර්තමානයෙහි යොදාගන්නා ප්‍රධාන ම අවිය වී ඇත්තේ දැනුම ය. බටහිරයෝ දැනුම යොදාගැනීමෙහි දී ත්‍රස්තවාදියෝ වෙති. අද ලෝකය පුරා බටහිර දැනුම් ත්‍රස්තවාදයක් පවතියි. අද අප විශ්වවිද්‍යාලවල හා පාසල්වල පමණක් නොව පෙර පාසල්වල ද ප්‍රධාන වශයෙන් උගන්වන්නේ බටහිරයන් පසුගිය අවුරුදු පන්සියයක් පමණ කාලයක නිර්මාණය කළ දැනුම ය. මේ දැනුම ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය මත පදනම් වෙයි. එබැවින් අපි පාසලේ දී ද විශ්වවිද්‍යාලයේ දී ද පැරණි ග්‍රීක දැනුම ද හදාරමු.

පෙරදිග දැනුම් හදාරන්නන්ගේ ප්‍රතිශතය එකට අඩු ය. එහෙත් ඔවුන් ද ඒ හදාරන්නේ බටහිර අච්චුව අනුව ය. ඇරිස්ටෝටල්ගේ දූප්පත් ද්විකෝටික න්‍යාය අපට පළමු ශ්‍රේණියේ සිට කියා දෙනු ලැබේ. එහෙත් බෞද්ධයන් ද අනුගමනය කරන චතුස්කෝටිකය ගැන අපට කියා දෙන්නේ නැත. මෙරට සිටින මහාචාර්යවරු ලෙස හැඳින්වෙන්නෝ ඇතැමෙක් චතුස්කෝටිකය ද්විකෝටිකයෙන් තේරුම් කිරීමට උත්සාහ ගනිති. ඒ තම බටහිර ස්වාමිවරුන් සැනසීම සඳහා ය. මේ උගත්තු බටහිර දැනුම් ත්‍රස්තවාදය හමුවේ දෙපා අස්සේ වලිගය ගසාගත් සුනඛ පෝතකයන් ලෙස හැසිරෙති. එහෙත් බොහෝ අයට සිතෙන්නේ ඔවුන් සිංහ පෝතකයන් ලෙස හැසිරෙන බව ය.

මිහිඳු හිමියන් මෙරට ට වැඩම කිරීමෙන් පසුව තවත් පොසොන් පොහොයක් පසුගිය දා ගෙවී ගියේ ය. දෙවනපෑ තිස් රජු මිහිඳු හිමියන්ට ප්‍රකාශ කෙළේ තමා තමාගේ නෑයකු හෝ නොනෑයකු හෝ නොවන බව ය. මිහිඳු හිමියෝ ඒ පිළිතුර පිළිගත්හ. එහෙත් මේ ප්‍රකාශය ඇරිස්ටෝටල්ගේ න්‍යායට හසු නො වේ. මේ පිළිතුර හමුවේ බටහිර ගණිතයෙහි කුලකවාදය අසරණ වෙයි. බටහිර ගණිතය මුළුමනින් ම මෙන් පදනම් වන්නේ කුලකවාදය මත ය. එහෙත් ඊනියා අපේ පාසල්වල ද විශ්වවිද්‍යාලවල ද (මේවා නමින් අපේ බව සැබෑ ය. ඒ නඩත්තු වන්නේ මෙරට ජනයාගේ මුදල්වලිනි. එහෙත් එහි ඉගැන්වෙන්නේ අපේ දැනුමක් නො වේ) මිහිඳු හිමියන්ගේ ප්‍රශ්න ඇරිස්ටෝටල්ගෙන් පරිබාහිරව සාකච්ඡා නො වේ. දැනට අවුරුදු විසි දෙකකට පෙර මිහිඳු හිමියන්ගේ ප්‍රශ්න චතුස්කෝටිකයට අනුව සාකච්ඡා කර කුලකවාදයෙහි දූප්පත්කම විස්තර කරන ලිපියක් කාලය සඟරාවෙහි ද දිවයින පුවත්පතෙහි ද පළ කෙළෙමි. මට හැකි අවස්ථාවල විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික ගණිතය ඉගෙන ගන්නා සිසුන්ට ඒ කියා දෙමි. එහෙත් එදා මෙදා වන තුරු මා හැරෙන්නට වෙනත් කිසිවකු මිහිඳු හිමියන්ගේ ප්‍රශ්නවල ඇති වැදගත්කම කියා දෙන බවක් දැනගන්නට නැත. ඒ ප්‍රශ්න පොසොන් පොහොයට දෙසන සාම්ප්‍රදායික බණට සීමා කෙරී ඇත.

බටහිර දැනුම් ත්‍රස්තවාදය එබඳු ය. ඒ ත්‍රස්තවාදයේ තරම බොහෝ දෙනාට තේරුම් ගැනීමට නො හැකි ය. මේ කරුණු මා සඳහන් කෙළේ බටහිරයන් අද මුළු ලොව ම පාලනය කිරීමේ දී දැනුම් ත්‍රස්තවාදය යොදාගන්නා අන්දම කීමට පූර්විකාවක් ලෙස ය. ඊනියා මානව හිමිකම් යනු කවරේ ද? මේ මානව අයිතිවාසිකම් බටහිර සංස්කෘතියේ මානව අයිතිවාසිකම් මිස ඊනියා වාස්තවික මානව අයිතිවාසිකම් නො වේ. බටහිර දැනුම් ත්‍රස්තවාදය විසින් යොදාගැනෙන අතිභයානක වචන දෙකක් නම් යථාර්ථය හා වාස්තවිකත්වය ය. ඊනියා යථාර්ථයක් ඇතැයි ද වාස්තවික වූ දැනුමක්

© Prof. Nalin De Silva

ඇතැයි ද බටහිර දැනුම් ත්‍රස්තවාදය විසින් ඉගැන්වෙයි. ඒ ඊනියා යථාර්ථය පිළිබඳ වාස්තවික වූ දැනුම බටහිර නිර්මාණය (සංස්කරණය) කෙරෙයි. අපට කළ හැක්කේ ඒ දැනුම ලබාගැනීම පමණ ය.

මානව අයිතිවාසිකම් ඇත්තේ බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය ප්‍රචලිත කිරීමට, තහවුරු කිරීමට හා බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය වෙනුවෙන් අනෙකුත් සංස්කෘතීන් නැතිකිරීමට දුර්වල කිරීමට ක්‍රියාකරන්නවුන්ට මිස අනෙක් අයට නො වේ. අද ගාසා තීරුවේ වාසය කරන ජනයාට ඊනියා මානව අයිතිවාසිකම් තිබේ ද? එහි ජනයා කුසගින්නේ තබමින් ඔවුන්ට බාධක පමුණුවන ඊශ්‍රායල් යුදෙව්වනට නම් මානව අයිතිවාසිකම් ඇත. පලස්තීන වැසියන්ට මානව අයිතිවාසිකම් නැත්තේත් ඊශ්‍රායල් යුදෙව්වනට මානව අයිතිවාසිකම් ඇත්තේත් කිනම් දේව භාස්කමකින් ද? ලංකාව සම්බන්ධයෙන් බෑන් කි මූන් මණ්ඩල පත්කරන්නේත් ජාත්‍යන්තර මුහුදේ මිනිසුන් ඝාතනය කරමින් ඊශ්‍රායලය කරන ත්‍රස්තවාදී ක්‍රියා සොයා බැලීමට ඊශ්‍රායලයට ම ව්‍යාජ කොමිසම් පත්කර ගැනීමට ඉඩ දී ඇත්තේත් කිනම් දේව භාස්කමකින් ද? ඇතැමුන්ට අනුව මේ බටහිරයන්ගේ දෙබිඩි ප්‍රතිපත්තියකි. එහෙත් ඒ එසේ නො වේ. ඊනියා මානව අයිතිවාසිකම් ක්‍රියාත්මක වන්නේ ම ඒ ආකාරයෙනි. යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙන් නිර්ණය වන මානව අයිතිවාසිකම් ඇත්තේ ඒ සංස්කෘතිය ප්‍රචලිත කරන්නන්ට ය. තහවුරු කරන්නන්ට ය. බටහිර යුදෙව් සංස්කෘතිය වෙනුවෙන් අනෙක් සංස්කෘතීන් මඩින්නන්ට ය. පොන්නනෝනගේ කොණ්ඩය පොන්නනෝනට අවශ්‍ය අන්දමට මිස පුංචි මැණිකේට අවශ්‍ය අන්දමට බැඳිය නො හැකි ය. පාවිච්චි කළ නොහැකි ය. අපේ ගැමියන් දන්නා මේ කරුණ මෙරට උගතුන් නොදැනීම අපේ අභාග්‍යයකි. බටහිර මානව අයිතිවාසිකම් පොන්නනෝනාගේ කොණ්ඩය වැනි ය.

බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය හා බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදය වෙනුවෙන් මෙරට පෙනී සිටින්නෝ බොහෝ වෙති. බටහිරින් මෙහෙයවනු ලබන ඔවුන්ගේ මුදලින් නඩත්තු වන රාජ්‍ය නොවන සංවිධාන මෙහි දී ප්‍රධාන ස්ථානයක් ගනියි. ඒ හැරෙන්නට ඇතැම් ආගමික සංවිධාන ද වෙයි. ඒ ආගම්වල ප්‍රධාන පූජකවරු ප්‍රසිද්ධියේ ම එහෙත් ඉතා සූක්ෂම ලෙස එහි දී කටයුතු කරති. අප බොහෝ අවස්ථාවල දී කියා ඇති පරිදි බටහිරයන් මේ සියලු සංවිධාන යොදාගන්නේ හැකි නම් සිංහල බෞද්ධ සංස්කෘතිය නැතිකිරීමට ය. බැරි නම් ඒ දුර්වල කිරීමට ය. මේ සියල්ලන්ට ම වඩා ඒ සම්බන්ධයෙන් සිංහල බෞද්ධ සංස්කෘතිය විසින් යොදාගනු ලැබුයේ දෙමළ ජාතිවාදය ය. දෙමළ ජාතිවාදය, රාජ්‍ය නොවන සංවිධාන, ඇතැම් ආගමික පූජකවරු, එක්සත් ජාතීන්ගේ සංවිධානය පමණක් නොව බටහිර දැනුම ද සමස්තයක් ලෙස ගත්කල බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයේ ආයුධ වෙයි. ඇතැම් උගත් සිංහලයන්ට ද සිංහලයන්ට ම විරුද්ධව ක්‍රියාකරන්නට සිදු වී ඇත්තේ ඔවුන් ලත් අධ්‍යාපනය හේතුකොට ගෙන ය.

දෙමළ ජාතිවාදය එදා මෙන් ම අද ද පවත්වාගෙන යනු ලබන්නේ බටහිර ත්‍රස්තවාදය විසිනි. ප්‍රභාකරන් පැරදවීමෙන් පසුව ද දෙමළ ජාතිවාදය බටහිර රටවල පවත්වාගෙන යනු දක්නට හැකි ය. අද මෙරට ඇතැම් පූජකවරුන් ඊනියා සංහිඳියාවක් ගැන කතාකරති. එහි වරදක් නැත. සිංහලයන්ගේ ඉතිහාසයෙහි මෙරටට පැමිණි විවිධ ජනවර්ගවලට ඔවුන් ඉතා කාරුණිකව හා සුහදත්වයෙන් සලකා ඇති බව පැහැදිලි ය. දැනුදු සිංහලයෝ මෙරට දෙමළ ජනයා සම්බන්ධයෙන් ඉතා මිත්‍රශීලීව කටයුතු කරති. එහෙත් මේ ඇතැම් පූජකයන් සිංහලයන්ට බයිලා කියන්නේ ඔවුන්ගේ දුර්දාන්ත අතීතය අමතක කරමිනි. පෘතුගීසීන්, ලන්දේසීන් හා ඉංගිරිසින් සිංහලයන්ට සැලකූ ආකාරය පිළිබඳ මතක් කිරීමට තරම් අතීතයට  අපි නො යමු. ඊනියා පළමු හා දෙවැනි ලෝක යුද්ධවලින් පසුව ජයග්‍රාහී බටහිර ජාතීන් පරාජිතයන්ට සළකා ඇත්තේ කෙසේ ද යන්නත් ඒ අවස්ථාවල එංගලන්තයේ පූජකවරු ඉංගිරිසි ආණ්ඩුවට දුන් උපදෙස් මතක් කරගන්නේ නම් ඒ නිකායවලට ම අයත් මෙරට පූජකවරු අපට බයිලා නොකියනු ඇත. මේ පූජකවරු අද සාන්තුවරයන් මෙන් හැසිරෙති. එහෙත් ඔවුන් ජයග්‍රහී වූ අවස්ථාවල ඔවුන් ක්‍රියා කර ඇත්තේ එයට හාත්පසින් ම විරුද්ධ ආකාරයකට ය. බෑන් කි මූන් යන ත්‍රස්තවාදයෙකි. ඔහු තම බලය යොදාගනිමින් බටහිරයන් වෙනුවෙන් අප රටේ ස්වෛරීභාවය නැතිකිරීමට ඉදිරිපත් වෙයි. ඔවුන් එහි දී යොදා ගන්නේ බටහිර දැනුම් ත්‍රස්තවාදය ය. අපි ඊනියා මානව අයිතිවාසිකම් පිළිබඳ බටහිර දැනුම මෙන් ම ස්වෛරීභාවයේ දුර්වල වීම පිළිබඳ බටහිර දැනුම වෙසින් එන බයිලා ද ප්‍රතික්ෂේප කරමු. අපි ස්වෛරීභාවය වෙනුවෙන් එක් කොන්දේසියක් දැනට පණවමු. ස්වෛරීභාවය සමමිතික විය යුතු ය. බටහිරයන් අපට යමක් කරන්නේ නම් අපට ද බටහිරයන්ට ඒ දෙය කළ හැකි විය යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva